**ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2018**

---

ජාතික මාර්ග ජාලයේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්.එල් - පී 108 දරන ණය ගිවිසුමේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකනු ලබන අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන හා ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මාර්ගවල ප්‍රධාන පාලම් ඉදිකිරීම මගින් ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීම හා එමගින් ආර්ථික සංවර්ධනයට දායක වීම මෙම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රුපියල් මිලියන 27,250 කට සමාන ජපාන යෙන් මිලියන 16,132 වන අතර එම මුදලින් රුපියල් මිලියන 20,914 කට සමාන ජපාන යෙන් මිලියන 12,381 ක් සැපයීමට ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ එහි කටයුතු 2013 මාර්තු මස ආරම්භ කළ අතර 2019 වර්ෂය වන විට අවසන් කිරීමට නියමිතයි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කරන ලද කරුණුවල බලපෑම හැර මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන මගින් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහය සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශණ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය වැඩසටහන ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා වැඩසටහනේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි. එම පාලනය හා සම්බන්ධ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය විසින් වාර්ෂිකව සහ කාලපරිච්ඡේදවලට අදාලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකි වන අයුරින් තම සියලුම ආදායම්,වියදම්,වත්කම් සහ වගකීම් සම්බන්ධ පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස්

--------------------------------

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

**පහත නිරීක්ෂණයන් සිදුකරන ලදී.**

| | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ, පාලම් ඉදිකිරීමේ කටයුතු වල නියැලී සිටින කොන්ත්‍රාත්කරුවකු හරහා ව්‍යාපෘතිය මගින් මෝටර් රථ 05 ක් රුපියල් මිලියන 44.83 ක වියදමින් මිලදීගෙන තිබූ අතර අදාල වත්කම්වල විවිධ ජීවකාලය සැලකිල්ලට නොගෙන සිවිල් වැඩ ප්‍රගතිය යටතේ පෙන්වා තිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්තිය වැරදි ලෙස භාවිතා කිරීම. | එකඟ වේ. මෙය 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. | මෝටර් වාහන 05 හි පිරිවැය වෙන වෙනම හඳුනාගෙන දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගිණුම්කරණ දෝෂයක් හේතුවෙන් සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති සිවිල් වැඩ ප්‍රගතිය හා ගෙවිය යුතු රඳවාගැනීම් වටිනාකම් රුපියල් මිලියන 94.65 ක් අඩුවෙන් පෙන්වා තිබුණි. | සිවිල් වැඩ ප්‍රගතියෙහි වටිනාකම අඩුවීම. | - එම - | සහතික කරන ලද වැඩවල වටිනාකම සිදුකරන ලද වැඩවල වටිනාකම ලෙස ගිණුම්ගත විය යුතුය. |
| (ඇ) | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වෙනත් විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘතියක් මගින් ගෙවන ලද රුපියල් මිලියන | ඉඩම් අත්පත්කර ගැනීම් පිරිවැය අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | ඉඩම් අත්පත් කර ගැනීම් පිරිවැය යටතේ ගිණුම්ගත කිරීම අවශ්‍ය වේ. |

10.04ක ඉඩම් අත්කර ගැනීම් වන්දි මුදල සැලකිල්ලට ගෙන ගිණුම්ගත කර නොතිබුණි.

**03. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියෙහි ලියකියවිලිවලට අනුව දකුණු, උතුර, වයඹ, සබරගමුව සහ බස්නාහිර පළාත් ජාතික මාර්ග 19 ක නව පාලම් 37 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරන ලද අතර කොන්ත්‍රාත් පැකේජ 05 ක් යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලදි. දකුණු පළාතේ පාලම් 10 ක ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන විට අවසන් කර ඇති අතර, 2015 මාර්තු 20 වන දින ආරම්භ කරනලද පොල්අතුමෝදර සහ ගොයියාපාන යන පාලම්වල වැඩ කටයුතු, වැඩබිම භාරදීමට ගතවන කාලය, අමතර වැඩ සහ උපයෝගිතා සේවා මාරු කිරීමේදී ප්‍රමාද වීම ආදිය හේතුවෙන් දින 166 සිට දින 438 දක්වා ප්‍රමාදයකින් අවසන් කර ඇත. 2016 නොවැම්බර් මස 24 දින ආරම්භ කරන ලද උතුරු පළාතේ නව | පාලම් ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීමේදී ප්‍රමාදයන් සිදුවීම. | ව්‍යාපෘතිය යටතේ පාලම් 37 ක් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් මුල් සැලස්ම තිබියදීත්, ඒ සඳහා අරමුදල් සම්පාදනය ප්‍රමාණවත් නොවීය. එම නිසා පාලම් 21 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. | මූලික සැලැස්මට අනුව ණය කාල සීමාව ඉකුත්වීමට පෙර පාලම් ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා පළමු වසර 02 තුළ ආරම්භ කළ යුතුය. |

පාලම් 08 ක ඉදිකිරීම් කටයුතු 2018 දෙසැම්බර් මස 31 වන විට දින 120 කට වඩා ප්‍රමාදයකින් අවසන් කර ඇත. තවද අනෙකුත් පළාත් 03 හි නව පාලම් 19 හි ඉදිකිරීම් කටයුතු 2019 ජුනි 30 දින වන විටද ආරම්භ කර නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නිසි ඉංජිනේරු අධ්‍යනයක් නොකර පාලම් ඉදිකිරීම සඳහා ප්‍රමාණ බිල්පත් සකස් කර ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස දකුණු පළාතේ පාලම් 10 ක අමතර වැඩ අයිතම 643 ක් යටතේ රුපියල් මිලියන 396.15 ක වියදමින් සිදුකර ඇත. තවද රුපියල් මිලියන 443.30 ක වියදමකින් අයිතම 832 ක් යටතේ උතුරු පළාතේ පාලම් 08 ක වැඩ 2018 දෙසැම්බර් 31 වන විටද නිමකර නොතිබුණි. ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පැකේජවල මූලික ප්‍රමාණ පත්‍රවල අයිතම 122 ක් යටතේ ඇතුළත් කර ඇති වැඩ කිරීමේ විෂය පථය පසුව සියයට සියයකට වඩා වැඩිකර ඇති බව තවදුටත් නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් පිරිවැය ඉහළ යාම. | නිශ්චිත විස්තරයකින් ආවරණය කළ නොහැකි අනපේක්ෂිත දෛනික වැඩ හා ප්‍රමාණ පත්‍රයෙහි දළ වශයෙන් වූ ප්‍රමාණවලට අදාල අමතර වැඩ. | ප්‍රමාණ පත්‍ර සකස් කිරීමට පෙර සවිස්තරාත්මක ඉංජිනේරු අධ්‍යන හා පාංශු පරීක්ෂණ පැවැත්වීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 80.71 ක් වන කොළඹ, ගාල්ල, හම්බන්තොට, වැල්ලවාය මාර්ගයේ පොල්අතුමෝදර පාලමේ ඉදිකිරීම් කටයුතු 2015 මාර්තු 20 වන දින ආරම්භ කරන ලද අතර තෝරාගත් ස්ථානයෙහි දුර්වල තත්ත්වය හේතුවෙන් 2016 වර්ෂයේදී අතහැර දමා ඇත. එය අතහැර දමනවිට රුපියල් මිලියන 17.99 ක වටිනාකමින් යුතු වැඩ ක්‍රියාත්මක වෙමින් පැවතුණ බව නිරීක්ෂණය විය. | පාර්ශවකරුවන්ට අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | උප පසෙහි අනපේක්ෂිත හැසිරීම හේතුවෙන් පාලමේ ව්‍යුහයේ සැලසුම වෙනස් කරන ලදී. සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ව්‍යාපෘතිවල මෙවැනි අනපේක්ෂිත වෙනස්කම් කලාතුරකින් සිදුවිය හැක. | ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර සවිස්තරාත්මක ඉංජිනේරු අධ්‍යන සහ පාංශු පරීක්ෂණ සිදුකළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය මගින් දකුණු පළාතේ පාලම් ඉදිකිරීමේ කටයුතුවල නියැලී සිටින කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ භාවිතය සඳහා මෝටර් වාහන 15 ක් කුලියට ගෙන ඇති අතර ඒ සඳහා ප්‍රමාණ පත්‍රයෙහි රුපියල් මිලියන 178.67 ක් වෙන්කර ගෙන තිබුණි. කෙසේවෙතත් වෙන් කර ඇති ප්‍රතිපාදනය ඉක්මවා 2018 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 254.42 ක් වියදම්කර තිබුණි. | ශ්‍රී ලංකා රජයට අමතර පිරිවැයකි. | වැඩ අධීක්ෂණය සඳහා දීර්ඝ කාලයක් වාහන අවශ්‍ය විය. | මූලික සැලසුම් කාලය තුළ ඉදිකිරීම් වැඩ කටයුතු අවසන් කිරීමට පියවර ගත යුතුය. |

### 3.3 ඌණ උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| නව පාලම් ඉදිකිරීම ප්‍රමාද වීම හේතුවෙන් ණය ගිවිසුමෙන් ලද ජපාන යෙන් මිලියන 12,381 ක ප්‍රතිපාදනවලින් සියයට 57 ක් වන | නව පාලම් 37 ක් ඉදිකිරීම සඳහා ජපාන යෙන් මිලියන 12,381 ක මුළු ප්‍රතිපාදනය | 2021 ජුලි 05 දින ගිවිසුම් කාලය ඉකුත් වීම හේතුවෙන් කොන්ත්‍රාත් පැකේජය 03 යටතේ සිවිල් වැඩ කටයුතු | ව්‍යාපෘතියේ කාල සීමාව තුළ පාලම් ඉදිකිරීම නිසි පරිදි නිම කිරීමට සැලසුම් |

| | | | |
|---|---|---|---|
| ජපන් යෙන් මිලියන 7,003 ක් පමණක් 2018 දෙසැම්බර් 31 වන විට භාවිතා කර ඇති බව නිරීක්ෂණය විය. තවද ණය නොගෙවා ඇති මුදල්වලින් රුපියල් මිලියන 68.53 ක් වන බැඳීම් ගාස්තු 2018 දෙසැම්බර් 31 දක්වා ණය දෙන ආයතනය මගින් අයකරගෙන ඇත. | භාවිතා නොවීම. | කරගෙන යාමට ආධාර දෙන ආයතනය අවසර ලබාදී නැත. | කිරීම අවශ්‍ය වේ. |

**3.4 ඉඩම් අත්කර ගැනීම මත ගැටළු**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ලද තොරතුරු අනුව පාලම් 13 ක් ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් පැකේජ 03 ක් යටතේ රජයේ ඉඩම් කැබලි 180 ක් ඇතුළත්ව ඉඩම් කැබලි 411 ක් අත්පත් කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර 2018 දෙසැම්බර් 31 වන විට ඉඩම් කැබලි සඳහා රුපියල් මිලියන 248.89 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. එයට අමතරව ප්‍රවර්තන වර්ෂය අවසන් වන විට වන්දි මුදල් ගෙවීමට ප්‍රමාද වීම මත රුපියල් මිලියන 27.82 ක මුදලක් පොලී වශයෙන් ගෙවා තිබුණි. | පාලම් ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම ප්‍රමාදවීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ පොලී වියදම ඉහළ යාම. | ප්‍රමාණවත් පරිදි අදහස් දක්වා නැත. | කොන්ත්‍රාත් වැඩ ආරම්භ කිරීමට පෙර ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව අත්පත් කර ගැනීම් සැලසුම් කිරීම, ප්‍රගතිය ඇගයීම් කිරීම, වන්දිගෙවීම් මත අධීක්ෂණය හා පාලනය අවශ්‍ය වේ. |